**ආලයඩිවේම්බු ප්‍රාදේශීය සභාව - 2023**
**-------------------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආලයඩිවේම්බු ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ආලයඩිවේම්බු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මාගේ වාර්තාවේ 1.6.1 ඡේදයේ ඇති (ඇ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කසළ ඉවත් කිරීමේ ගාස්තු සහ සංස්කෘතික ශාලා ගාස්තු ඇතුළත්ව එකතුව රු. 729,158ක් මූල්‍ය ප්‍රකාශනයේ ආදායම් ලෙස ගිණුම්ගත නොකර වගකීම් ලෙස දක්වා තිබුණි. | දැනට ආදායම් ලෙස මාරු කරමින් පවතින බව | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළව ගෙවිය යුතු තාවකාලික සේවක වැටුප්, සේවක අර්ථසාධක දායක මුදල් සහ සේවක භාරකාර දායක මුදල් එකතුව රු. 388,332ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී අදාළ වර්ෂය තුළම ගෙවා අවසන් කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ වියදම් නිසි පරිදි මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාවේ සේවකයින් 04 දෙනෙකුට ලබාදී තිබුණු වැරදි වැටුප් පරිවර්තන හේතුවෙන් ඔවුන්ගෙන් අයවිය යුතු සහ ඔවුන්ට ගෙවිය යුතු පිළිවෙලින් රු.293,955 සහ රු.59,986 මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අවස්ථාවන් පැන නැගීමේදී මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කරන බව. | වත්කම් සහ වගකීම් නිසි පරිදි මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2022 වර්ෂයේදී පළාත් පාලන අමාත්‍යාංශය සහ පළාත් පාලන දෙපාර්තුමේන්තුවලින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු අයිතම් වර්ග 07 වටිනාකම රු.14,174,190 ක් ගණනය කර තිබුණද, ඒවා මූල්‍ය ප්‍රකාශන වල ස්ථාවර වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරි මුදල් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ස්ථාවර වත්කම් ලෙස දැක්වීමට කටයුතු කරන බව | ගිණුම්වල ස්ථාවර වත්කම් ලෙස දැක්වීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,477,087 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,836,209 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,500,000 | 1,151,488 | 1,104,579 | 46,909 | 1,000,000 | - | - | 135,184 |
| (ii) | කුලී | 5,950,000 | 6,181.187 | 5,542,903 | 666,783 | 4,670,000 | 2,853,961 | 2,898,345 | 665,164 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,195,000 | 692,090 | 675,410 | 16,680 | 1,165,000 | 629,780 | 629,780 | 16,680 |
| (iv) | වෙනත් ආදායම් | 11,910,000 | 11,550,940 | 11,550,940 | - | 6,835,000 | 1,130,132 | 3,688,581 | - |
| (v) | එකතුව | 21,555,000 | 19,575,705 | 18,873,832 | 730,372 | 13,670,000 | 4,613,873 | 7,216,706 | 817,028 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.3,072,174 ක් හා මුද්දර ගාස්තු රු.3,458,500 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව. | නිසි කාල පරිච්ඡේදය තුළ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

(අ) සභාව විසින් 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය අතිරික්ත මුදල් ස්ථාවර අතිරේක මුදල් සභාවේ අවසානය වන විට බැංකු ශේෂය ලෙස තැන්පතුවල යොදවා පොලී අරමුණු ළඟාකරගත

| | | | |
|---|---|---|---|
| | රු.16,755,854 දක්වා තිබුණද, සභාවට ආදායම් ලබාගත හැකි මාර්ග වල යෙදවීමට කටයුතු කර නොතිබුණි | ආදායම් ලබා ගන්නා අතර අවශ්‍ය පරිදි අතිරේක මුදල් තැන්පතුවල යෙදවීමට කටයුතු කරන බව. | හැකි ලෙස යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේ සිට 2023 වර්ෂයේ අවසානය දක්වා කඩකාමර 09 ක කුලී වටිනාකම් තක්සේරු කර කුලියට දීමට කටයුතු කර නොතිබීම නිසා සභාවට වාර්ෂිකව රු.939,240 ක ආදායමක් අහිමි වී තිබුණි. | ගොඩනැගිළි ප්‍රතිසංස්කරණය කර ආදායම් වැඩිකර ගැනීම සඳහා නව පෙනුමකින් කුලියට දීමට කටයුතු කර ඇති බව. | කුලී වටිනාකම් තක්සේරු කර සියලුම කඩකාමර කුලියට දීමට කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු සහ සභාව විසින් උපයෝජනය කරනු ලබන ඉඩම්, ගොඩනැගිළි සහ වාහන 31 පිරිවැය සහ ඒවායේ ප්‍රත්‍යාගණන වටිනාකම් යනාදිය ගණනය කර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනය කර ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු සිදුකරන බව. | පිරිවැය සහ තක්සේරු වටිනාකම් අනාවරණය වන ලෙස ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවට අයත් වාහන 04 ක් අලුත්වැඩියා කර නැවත උපයෝජනය කිරීමට හෝ අපහරණය කිරීමට හෝ සභාව කටයුතු කර නොතිබුණි. | අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට තවදුරටත් පියවර ගනිමින් පවතින බව. | වාහන අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොල්තෙල් නිස්සාරණ යන්ත්‍රය සහ බෝතල් 2023 ජූලි 11 වැනි දින මිලදී ගෙන තිබුණද, ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් නොවීම හේතුවෙන් නිෂ්පාදනය සිදුකිරීමට නොහැකි වී තිබුණි. | වැඩ කටයුතු ආරම්භ කර ඇති බැවින් මෙම වැඩ නිමවීමෙන් පසු පොල්තෙල් නිස්සාරණ යන්ත්‍රය ක්‍රියාත්මක කරන බව. | කඩිනමින් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවකයින් 05 දෙනෙකුගෙන් දීර්ග කාලයක් අය නොවී පවතින රු. 290,070 ක ආපදා ණය හිඟය අයකර ගැනීමට හෝ සුදුසු පරිදි කටයුතු කිරීමට සභාව විසින් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී මෙම නිලධාරීන්ට ආදාළ පාරිතෝෂිත ලැබීමේදී ණය ශේෂය අයකරගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 වාහන උපයෝජනය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| සභාව විසින් උපයෝජනය කරනු ලබන වාහන 08 ක අයිතිය පවරා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව. | වාහනවල අයිතිය සභාවේ නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |